**බේස් ලයින් මාර්ග ව්‍යාපෘතියේ අදියර III - 2021**

---

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ - අදියර III 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2009 නොවැම්බර් 19 දින පවත්වන ලද කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ගනු ලැබුණු තීරණයක් යටතේ ක්‍රියාත්මක කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ තොරතුරු අනුව, මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කිරුළපන සිට කොළඹ හොරණ මාර්ගය දක්වා මීටර් 860ක් දිග නව මාර්ගයක් ඉදි කිරීම මඟින් මාර්ග තදබදය අවම කිරීමයි. දෙපස උස් වූ ඇවිදින මං තීරු සහිතව එක් පසකට ද්විත්ව ප්‍රවාහන මංතීරු සහිතව මංතීරු 03 සහ මාර්ගය වෙන්කරන මැද පිහිටි කොටසකින් මෙම මාර්ගය ඉදිකෙරේ. මෙම ව්‍යාපෘතිය 2009 නොවැම්බර් 19 දින පවත්වන ලද කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ගත් තීරණයක් යටතේ ක්‍රියාත්මක වේ. ඉඩම් අත්පත්කර ගැනීම සඳහා රු. මිලියන 4,860ක් සහ ඉදිකිරීම් පිරිවැය සඳහා රු.මිලියන 5,250 ලෙස ව්‍යාපෘතියේ අපේක්ෂිත පිරිවැය ඇස්තමේන්තු කර ඇත. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ඉදිකිරීම් සඳහා අවශ්‍ය අරමුදල් 2022 ජුනි 30 දින වන විටත් සැලසුම් කර නොතිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දැක්වෙන කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්,අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙලිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම,ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන ගැටලුව | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| වන්දි රු.මිලියන 57.64ක් සම්බන්ධ රු.මිලියන 28.19ක ගෙවිය යුතු පොළී මුදල ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කර නොතිබුණි. | 28.19 | මෙම කරුණ සමග එකග වේ. මේවන විට මෙය නිවැරදි කිරීමට නිසි පියවර ගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැනටමත් දක්වා ඇති රු.මිලියන 57.64ක ගෙවිය යුතු වන්දි සම්බන්ධ රු.මිලියන 28.19ක පොළිය හඳුනාගෙන වාර්තා කිරීමට අවශ්‍ය වේ. |

### 2.2. කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ පිරිවැය සහ කොළඹ ප්‍රදේශයේ රථවාහන තදබදය අඩු කිරීම සඳහා එහි වැදගත්කම පිළිබද අදහස් සලකමින් 2009 වර්ෂයේදී කිලෝමීටර් 7.42ක මාර්ගයේ මුළු දිග කිලෝමීටර් 0.86ක් දක්වා කිලෝමීටර 6.56කින් අඩු කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 12ක් | එකගවේ. විවිධ ආයතන සම්බන්ධ වීම සහ නීතිමය අවශ්‍යතාවයන් හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කිරීමට සැලකිය යුතු කාලයක් ගතවී තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ගෙවීම්වල ප්‍රමාදය සඳහා අරමුදල් සැපයීම ප්‍රධාන බාධකය විය. එමනිසා සිවිල් වැඩ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගතවී ඇතත් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිරිවැය සඳහා ශ්‍රී ලංකා රජය පිළිවෙලින් එකතුව රු. මිලියන 3,323ක් සහ රු. මිලියන 30ක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | ලැබී තිබුණු තොරතුරු අනුව ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා රු. මිලියන 625ක මුදල් ප්‍රතිපාදන ශ්‍රී ලංකා රජයෙන් ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, මුල් අදියරයේදී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට ව්‍යාපෘතිය විසින් නිසි පියවර ගෙන නොතිබුණි. 2021 ඔක්තෝබර් 25 දින ලංසු සඳහා ආරාධනා කර තිබුණු අතර ලංසු 2021 දෙසැම්බර් 02 තෙක් විවෘත කර තිබුණි. 2022 මැයි 31 වන විටත් සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මුල් ප්‍රතිපාදනයෙන් වෙනත් ව්‍යාපෘති වෙත රු.මිලියන 187ක ප්‍රතිපාදන මාරු කර තිබුණු අතර ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන් රු.මිලියන 438ක ඉතිරි ප්‍රතිපාදන උපයෝජනයකින් තොරව ව්‍යාපෘතියේ පැවතුණි. | රු.මිලියන 1,074ක වාර්ෂික ප්‍රතිපාදනයෙන් වර්ෂයේ මුල් කාර්තු දෙක තුළදී ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය අග්‍රිම ලැබී යැයි උපකල්පනය කරමින් සිවිල් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, එය ප්‍රමාද වූ අතර ඉඩම් අත්පත්කර ගැනීමේ ගෙවීම් කටයුතු සඳහා රු.මිලියන 904.6ක් පමණක් 2021 ඔක්තෝබර් අප වෙත ලැබී තිබුණි. ඒ අනුව සැලසුම් කළ සිවිල් ඉදිකිරීම් කටයුතු ප්‍රසම්පාදනය වසර අවසානය දක්වා ප්‍රමාද කිරීමට සිදුවිය. | සමස්ත සැලැස්ම සලකමින් අත්පත් කර ගත හැකි ඉලක්ක තීරණය කළ යුතු අතර ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය. |

## 3. ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සංශෝධිත වැඩ විෂය පථය මත ඉඩම් කොටස් 200ක් අත්පත්කර ගැනීමට අවශ්‍ය වූ අතර 2015දී ඉඩම් කොටස් 193ක් සඳහා 38(ආ) වගන්තිය නිකුත්කර තිබුණද ව්‍යාපෘතිය සියයට 49ක නියෝජනය කරන ඉඩම් කොටස් 98ක් පමණක් අත්කරගෙන තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට වන්දි මුදල් රු.මිලියන 2,534ක් ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘතියේ අරමුදල් පහසුකම්වල හිගය හේතුවෙන් 2021 දෙසැම්බර් 31දින වනවිටත් රු.මිලියන 775ක පොළිය ඇතුලුව රු.මිලියන 838ක වන්දි මුදලක් ගෙවිය යුතුව පැවතුණි. | අපි කොටස් 68ක් සඳහා ගෙවා තිබුණු අතර තවත් කොටස් 30ක් මාර්ග සහ වෙන්කිරීම් ලෙස අත්කරගෙන තිබුණි. ඒ අනුව කොටස් 98ක් අත්කරගෙන මේවන විට නිරවුල් කරගෙන ඇත. මෙය ව්‍යාපෘතියේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 67ක් නියෝජනය කරයි. | ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |